## ජාතික අධ්‍යාපන ආයතනය

## අධ්‍යාපන කළමනාකරණය පිළිබඳව අධ්‍යාපනපති පාඨමාලාව

## MEd (Education Management) 2023/2024 (SLQF 10)

ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා කළමනාකරණ පීඨයේ අධ්‍යාපන පරිපාලන හා සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන උක්ත පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**පාඨමාලාව පැවැත්වෙන ස්ථානය** : **අධ්‍යාපන පරිපාලන හා සංවර්ධන දෙපාර්තමේන්තුව, අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා කළමනාකරණ පීඨය, ජාතික අධ්‍යාපන ආයතනය, මීපේ හන්දිය, පාදුක්ක.**

**පාඨමාලා කාලසීමාව** : අවුරුදු දෙකයි. (සති අන්තයේ සහ අවශ්‍යතාවය පරිදි සතියේ දින සවස 6.00 න් පසු දේශන පැවැත්වේ.)

**මාධ්‍යය** : සිංහල හා දෙමළ

**පාඨමාලා ගාස්තු හා වෙනත් ගාස්තු:**
අයදුම්පත් ගාස්තුඃ- 1500/-
ලියාපදිංචි ගාස්තුවඃ- 5000/-
පාඨමාලා ගාස්තුවඃ- 150,000/- (වාරික 2 කින් ගෙවිය හැක)

**විභාග ගාස්තු** : ආයතනය මගින් තීරණය කරන පරිදි

**පවත්වන ආකාරය** : සම්මිශ්‍රිත ක්‍රමය (Blended Learning) - Online / Face to Face

**2023 ජනවාරි මස පාඨමාලාව ආරම්භ කිරීමට නියමිතය.**

**ඉල්ලුම් කිරීම සඳහා සුදුසුකම් :**

(i) අධ්‍යාපනවේදී උපාධිය

හෝ

ඕනෑම විෂය ක්ෂේත්‍රයකින් ලබා ගත් ප්‍රථම උපාධියක් සමඟ අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම.

**සහ**

(ii) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය (SLEAS) / ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය (SLTES) / විදුහල්පති සේවය (SLPS) / ශ්‍රී ලංකා ගුරු උපදේශන සේවය (SLTAS) /ශ්‍රී ලංකා ගුරු සේවයේ 1 පන්තියේ (SLTS - I) හෝ අධ්‍යාපන අමාත්‍යාංශයට අනුබද්ධ වෙනත් අධ්‍යාපන ආයතනයක ප්‍රධානී තනතුරක් හෙබවීම

බඳවා ගැනීමේ ක්‍රමය :

- සම්මුඛ පරීක්ෂණයක් මගින් **හෝ** ප්‍රවේශ විභාගයක් හා සම්මුඛ පරීක්ෂණය මගින් සිදු කරනු ලැබේ. ප්‍රවේශ විභාගය, පැය 02 ක අධ්‍යාපනය පිළිබඳ සාමාන්‍ය දැනීම පිලිබඳ ප්‍රශ්න පත්‍රයක් හා පැය 01 ක අභියෝගතාව පිළිබඳ ලිඛිත ප්‍රශ්න පත්‍රයකින් සමන්විත වේ.

- අදාළ අයදුම්කරුවන් තෝරා ගනු ලබන අධ්‍යයන වර්ෂයේදී ජාතික අධ්‍යාපන ආයතනයේ කිසිදු පූර්ණ කාලීන /අර්ධ කාලීන පාඨමාලාවක් හෝ කිසියම් ආයතනයක පූර්ණ කාලීන පාඨමාලාවක් හදාරමින් නොසිටිය යුතුය.

අයදුම්පත් යොමු කළයුතු ආකාරය :

1. ජාතික අධ්‍යාපන ආයතනයේ විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ (https://www.exams.nie.lk/intakes/new) හි ඇති මාර්ගගත පෝරමය (Online Form ) පිරවීම මගින්

**සහ**

2. ජාතික අධ්‍යාපන ආයතනයේ විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ (https://www.exams.nie.lk/intakes/ new) ඉංග්‍රීසි භාෂාවෙන් ඇති ඉල්ලුම් පත්‍රය ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව **ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් නමින්, ලංකා බැංකුවේ ඕනෑම ප්‍රධාන ශාඛාවකින්** **ගිණුම් අංක 607628** ට අයදුම්පත් ගාස්තු රු. 1500/-ක් බැර කළ යුතුය. ලදුපත පිරවීමේ දී අයදුම්කරන්නාගේ නම හා MEd (Education Management) ලෙස සඳහන් කරන්න.
   එම ලදුපත, අයදුම්පත සමග අමුණා **අධ්‍යක්ෂ, අධ්‍යාපන පරිපාලන හා සංවර්ධන, අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා කළමනාකරණ පීඨය, ජාතික අධ්‍යාපන ආයතනය, මීපේ හන්දිය, පාදුක්ක** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් **2022 සැප්තැම්බර් මස 09** වන දිනට පෙර එවිය යුතුය. අයදුම්පත බහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ MEd (Education Management) 2023/2024 - (සිංහල / දෙමළ) යනුවෙන් සඳහන් කළ යුතුය.

- ඔබගේ අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප වුවහොත් අයදුම්පත් ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.
- වැඩිදුර විස්තර සඳහා 0117601436 දුරකථන අංකයට සතියේ දිනවල පෙ.ව 9.00 සිට ප.ව 4.00 දක්වා අමතන්න.

ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම.